
# 6 ශ්‍රේණිය - පුනරීක්ෂණ
## 1 පත්‍රය

1. තුන් මිලියන එක්දහස් පන්සිය තුන ඉලක්කමෙන් ලියන්න.
2. 347 + 198 අගය සොයන්න.
3. 5439 හි 4න් නිරූපිත අගය ලියන්න.
4. 2031 යන සංඛ්‍යාව ගණක රාමුවක නිරූපණය කරන්න.
5. වෘත්ත 5 ක් භාවිතා කොට වෘත්ත රටාවක රූපසටහනක් අදින්න.
6. 3873 යන සංඛ්‍යාව විහිදුවා ලියන්න.
7. ප.ව. 3.45 සම්මත ආකාරයෙන් ලියන්න.
8. පහත දැක්වෙන සංඛ්‍යා රේඛාව මත +3 හා -2 නිරූපණය කරන්න





9. හිස්තැන් පුරවන්න.

පැය 1 = මිනිත්තු .................. = තත්පර ..................

10. අගය සොයන්න.

$$\begin{array}{r} 8439 \\ -\ 3927 \\ \hline \\ \hline \hline \end{array}$$

11. රූපයේ වෘත්තය මත දැක්වෙන ලක්ෂ්‍ය 2 ක් ලියන්න.



12. 64 x 1000 = ☐ හිස් කොටුව පුරවන්න.

13. හිස්තැන් සඳහා "<" හෝ ">" යොදා සම්බන්ධ කරන්න.


1) 18 ...................20 2) 11 .................6

14. 75 ආසන්න දහයේ ගුණාකාරයට වටයන්න.

15. ඔබ උදෑසන ඉර පායන දිශාවට මුහුණලා සිටගත් විට ඔබගේ වම් අත පිහිටන්නේ කුමන දිශාවට ද?

16. යම් සංඛ්‍යාවක් ආසන්න දහයේ ගුණාකාරයට වැටයූ විට අගය 80 වේ. එම සංඛ්‍යාවට තිබිය හැකි විශාලතම අගය ලියන්න.

17. රූපයේ දැක්වෙන කෝණ හඳුන්වන්න.




18. සමීර තම මිතුරෙකුගේ නිවසට යාමට පෙ.ව. 7.30 ට පිටත් විය. ඔහු මිතුරාගේ නිවසට පැමිණියේ පෙ.ව.9.45 ට නම් ගමනට ගතවූ කාලය සොයන්න.

19. 214454299 යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියා කියවන ආකාරය ද ලියන්න.

20. සබන් කැට 3ක මිල රුපියල් 120 කි. සබන් කැට 5ක මිල කීයද?

# 11 පත්‍රය

1. රූපයේ දී ඇති ලක්ෂ්‍ය අතරින්




I. A වෘත්තය මත පිහිටීම් දැක්වෙන අක්ෂර නම් කරන්න
II. B වෘත්තය ඇතුළත පිහිටීම් දැක්වෙන අක්ෂර නම් කරන්න
III. C වෘත්තයට පිටත පිහිටීම් දැක්වෙන අක්ෂර නම් කරන්න
IV. B වෘත්තය මත පිහිටීම් දැක්වෙන අක්ෂර නම් කරන්න

2. 999999 + 1 පිළිතුර කියවන ආකාරය ලියන්න.

I. 83427 , යන සංඛ්‍යාවේ 3
 a) පිහිටන ස්ථානය
 b) ස්ථානීය අගය
 c) නිරූපිත අගය ලියන්න

ii) 0,2,4,7,8,9 යන ඉලක්කම් භාවිත කර ලිවිය හැකි විශාලතම සංඛ්‍යාව ලියා කියවන ආකාරය ලියන්න.

iii) $7 \times 1000 + 3 \times 100 + 2 \times 10 + 7 \times 1$ මඟින් දැක්වෙන සංඛ්‍යාව ලියන්න.

3. හිස් කොටු සඳහා අගයන් ලියන්න

$$\begin{array}{r} 8\ 9\ 2 \\ +\ \square\square\square \\ \hline 1\ 1\ 3\ 0 \\ \hline \end{array}$$

II. පාසලක සිටින මුළු සිසුන් ගණන 765 කි. ගැහැණු ළමුන් ගණන 298 කි. පාසලේ සිටින පිරිමි ළමුන් ගණන සොයන්න.

III. සුදුසු අගයන් යොදා හිස්තැන් පුරවන්න

|   |   |   |   |   |
|---|---|---|---|---|
|   |   |   | 5 | 8 |
|   | × |   | 3 | 4 |
|   |   | □ | 3 | □ |
|   | 1 | 7 | □ | 0 |
|   | 1 | □ | 7 | □ |

iv. 327 × 1000 = ............ හිස්තැන පුරවන්න.

4.

|   | පැය | මිනිත්තු |
|---|---|---|
|   | 8 | 12 |
| - | 3 | 25 |
|   |   |   |

|   | මිනිත්තු | තත්පර |
|---|---|---|
|   | 5 | 25 |
| + | 2 | 50 |
|   |   |   |

iii. සචිනි තම රැකියා ස්ථානයට පිටත් වෙන්නේ පෙ.ව. 6.45 ට ය. මෙම වේලාව සම්මත ආකාරය ට ප්‍රකාශ කරන්න.

iv. රුචිනි ප්‍රශ්න පත්‍රයකට පිළිතුරු ලිවීමට ආරම්භ කළේ පෙ.ව. 8.30 ට ය. පිළිතුරු ලිවීම අවසන් කළේ පෙ.ව. 11.45 ට ය. මේ සඳහා ගත වූ කාලය සොයන්න.

5. I. -3 හා 5 සංඛ්‍යා රේඛාවක් මත ලකුණු කරන්න.

ii. පාර් සල් 4ක ස්කන්ධය පහත පරිදි වේ.

| 15kg | 25kg | 30kg | 40kg |
|---|---|---|---|
| A | B | C | D |

මෙම තොරතුරු දී ඇති සංඛ්‍යා රේඛාව මත ලකුණු කර අක්ෂරය ලියන්න

iii. C පාර්සලයේ ස්කන්ධය A පාර්සලයේ ස්කන්ධය මෙන් කී ගුණයක් ද?

iv. 50kg ක ස්කන්ධයක් ඇති පාර්සලයක් ලැබුණේ නම් එම අගය සංඛ්‍යා රේඛාව මත ලකුණු කර E ලෙස නම් කරන්න.

b) රූපයේ දැක්වෙන අංක කර ඇති කෝණ කුමන වර්ගයට අයත් දැයි ලියන්න.

